# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1530/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 01/10/2024<br>පැය 1855 |

## මාධ්‍ය නිවේදනය

**ලෝක ළමා දිනය වෙනුවෙන් "මගහැරුණු පාඩම" මැයෙන් හරවත් රසවත් වැඩසටහනක් - පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යංශය.**

"සෙනෙහසේ දැත් දිගු කර රකිමු වැඩිහිටි ළමා පරපුර" යන තේමාව පෙරදැරිකර සමස්ථ ලෝකයම අන්තර් ජාතික ලෝක ළමා දිනය හා වැඩිහිටි දිනය සමරනු ලැබූ 2024 ඔක්තෝම්බර් 01 වන අද දින, ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව සංවිධානය කළ දේශන හා සංදර්ශන මාලාවක් "දරුවන් රැකගමු සමසේ සලකමු" යන තේමාව යටතේ ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනියගේ ප්‍රධානත්වයෙන් මානෙල් වත්ත නාගනන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ දී පැවැත්වුනි.

මෙම වැඩසටහනට කැළණිය අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 10 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1000 ක් පමණ සහභාගී වූ අතර, එම දරු දැරියන් උදෙසා හරවත් දේශනයන් පැවැත්වූ අතර, පොලිස් සංස්කෘතික, පොලිස් තූර්යවාදක සහ පොලිස් නිල සුනඛ යන කොට්ඨාස වල නිලධාරීන්ගේ නැටුම්, ගැයුම් හා සංදර්ශන රසවිදීමට අවස්ථාව උදාකර දෙන ලදී.

මෙම අවස්ථාවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර, බස්නාහිර පළාත් උතුර කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති කපිල කඩුපිටිය, ළමා හා කාන්තා අපයෝජන දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර, ළමා හා කාන්තා කාර්යංශයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලලිත් අබේසේකර යන මහත්ම මහත්මියන් ඇතුළුව නිලධාරීන් රැසක් සහභාගී විය.






මග හැරුණු


මග හැරුණු පාඩම
HERO
CBL
Anchor







පොලිස් මාධ්‍ය කොට්ඨාසය.